සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண சபையின் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# වර්ෂ අවසාන පරීක්ෂණය - 2018

12 ශ්‍රේණිය | ආර්ථික විද්‍යාව II | 21 | S | II | කාලය පැය 03 යි

උපදෙස් -

❖ 'අ' උපකොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද 'ආ' උපකොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## 'අ' උප කොටස

01. 1) තේරීම කිරීමට සිදුවන්නේ හිඟකමේ ප්‍රතිඵලයක් නිසාද? පැහැදිලි කරන්න. (ලකුණු 02)

2) මානව සම්පත් සහ දේපල සම්පත් ආර්ථික සම්පත් ලෙස සලකන්නේ ඇයි? (ලකුණු 02)

3) නිෂ්පාදන හැකියා මායිම වක්‍රයක් යන්න පැහැදිලි කර වැඩිවන ආවස්ථික පිරිවැය හැකියා මායිම වක්‍රයක් ඇසුරෙන් දක්වන්න. (ලකුණු 04)

4) ශ්‍රමය සහ ව්‍යවසායකත්වය මානව සම්පත් වුවද නිෂ්පාදන සාධක ලෙස ඒවා එකිනෙකට වෙනස් වන්නේ කෙසේදැයි විමසන්න. (ලකුණු 04)

5) පහත දැක්වෙන සිදුවීම හැකියා මායිම වක්‍ර ඇසුරෙන් පැහැදිලි කරන්න.
අ) රෙදි සහ ධාන්‍ය නිපදවන ආර්ථිකයක පැවති නිෂ්පාදනයේ අකාර්යක්ෂමතා අඩු වීම.
ආ) චීනය සහ ශ්‍රී ලංකාව අතර පැවති වෙළඳ ගිවිසුම අවලංගු කිරීම ක්ෂණිකවම ශ්‍රී ලංකා ආර්ථිකයට බල පෑ හැකි ආකාරය
ඉ) තේ රබර් නිෂ්පාදනය කරන සරල ආර්ථිකයක තේ වගාවට යොදා ගත් ඉඩම් වැඩි ප්‍රමාණයක් රබර් නිෂ්පාදනය සඳහා යොදා ගැනීම
ඊ) එක්තරා ආර්ථිකයක නිපදවන කාර්මික භාණ්ඩ නිෂ්පාදනයේ ඇති වූ තාක්ෂණික දියුණුව නිසා එම භාණ්ඩ නිෂ්පාදනයේ සේවා වියුක්තියක් හට ගැනීම
(එක් කොටසකට ලකුණු 02 බැගින්)

02. 1) කවර භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන්නේද? යන ප්‍රශ්නය විවිධ ආර්ථික පද්ධති විසින් විසඳා ගන්නේ කෙසේද? (ලකුණු 04)

2) ශ්‍රී ලංකා ආර්ථිකයක මිශ්‍ර ආර්ථිකයක් ලෙස හඳුන්වන්නේ ඇයි? (ලකුණු 04)

3) වෙළඳපල ආර්ථිකයක මිල යන්ත්‍රණය මඟින් ඉටුකරන කාර්යයන් කවරේද? (ලකුණු 04)

4) වෙළඳපොල ආර්ථිකයක පාරිභෝගික ස්වාධිපත්‍යයක් ඇතැයි පැවසෙන්නේ මන්ද? (ලකුණු 04)

5) ආර්ථික පද්ධතියක කාර්යසාධනය ඇගයීම සඳහා යොදාගන්නා නිර්ණායක කවරේද? (ලකුණු 04)



Scanned by CamScanner

03.

1) "වෙළඳපලක්" යන්න හඳුන්වන්න.ආර්ථික විශ්ලේෂණයේදී භාවිතයට ගන්නා වෙළඳපල වර්ග කවරේද? (ලකුණු 04)

2) ඉල්ලුම් ශ්‍රිතය තුළ අඩංගු ස්වායත්ත විචල්‍යයන් නම් කරන්න. (ලකුණු 04)

3) "වෙළඳපල සමතුලිතය" සත්‍ය වෙළඳපලක් අවස්ථාවක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

4) තරඟකාරී වෙළඳපලක ඉල්ලුම් ශ්‍රිතය $Qd = 50 - 2p$ වන අතර සැපයුම් ශ්‍රිතය $Qs = -30+3p$ වෙ.

අ) වෙළඳපල සමතුලිතයේදී ඉල්ලුම් නම්‍යතාවය ගණනය කරන්න. (ලකුණු 01)

ආ) වෙළඳපල සමතුලිතයේදී සැපයුම් නම්‍යතාවය ගණනය කරන්න. (ලකුණු 01)

ඊ) ප්‍රමාණය ඒකක 20 දී අයි ඉල්ලුම් මිලත් ප්‍රමාණය ඒකක 40 දී අයි සැපයුම් මිලත් ගණනය කරන්න. (ලකුණු 02)

5) රජය භාණ්ඩයක් සඳහා උපරිම මිලක් නියම කිරීමේ ප්‍රතිවිපාක කවරේද? (ලකුණු 04)

04.

1) භාණ්ඩයක සැපයුමේ වෙනසක් ඇතිකරන සාධක කවරේද?. (ලකුණු 04)

2) සැපයුම් වක්‍රයක අන්ත : බණ්ඩය වෙනස් වන විට එහි ලක්ෂ්‍ය සැපයුම් නමයතාවය වෙනස් වන ආකාරය යෝග්‍ය රූප සටහනකින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

3) "ආදායම ඉල්ලුම් නම්‍යතා අගය" මත භාණ්ඩ වර්ග කළ හැකිය.පැහැදිලි කරන්න. (ලකුණු 04)

4) රජය නිෂ්පාදන සහනාධාරයක් ලබා දුන් විට භාණ්ඩයක මිල වෙනස් නොවන්නේ කුමන තත්වයක් යටතේද? රූප සටහනක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

5) එක්තරා භාණ්ඩයක මිල සැපයුම් නම්‍යතා සංගුණකය 1.2 ක් වන අතර මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය -0.3 ක් වේ.මෙම භාණ්ඩයේ මිල මත රු: 30 ක බද්දක් පැන වූ විට ගැනුම්කරුවා ගෙවන මිල කොපමණකින් වෙනස් වේද? (ලකුණු 04)

05.

1) "ඉල්ලුම් නීතිය" යන්න හඳුන්වා ඉල්ලුම් නීතියට පටහැනි වන්නේ කවර අවස්ථාවලදීදැයි දක්වන්න. (ලකුණු 04)

2) මිල අඩුවීමක ආදේශන ප්‍රතිවිපාකය හා ආදායම් ප්‍රතිවිපාකය පැහැදිලි කරන්න. (ලකුණු 04)

3) එක්තරා භාණ්ඩයක මිල රුපියල් 10 ක් වන විට අලෙවි ආදායම රුපියල් 5000 කි.මිල රුපියල් 20 ක් වන විට අයි ඉල්ලුමක් හෝ අයි සැපයුමක් නැත.මිල රුපියල් 2 ක් වන විට සැපයුම් ප්‍රමාණය ශූන්‍ය වේ.සමතුලිත ප්‍රමාණය ඒකක 200 කි.

අ) ඉහත දත්ත භාවිතයට ගෙන ඉල්ලුම් හා සැපයුම් වක්‍ර අඳින්න. (ලකුණු 04)

(ආ) සමතුලිත මිලේදී නිෂ්පාදන අතිරික්තය ගණන් බලන්න. (ලකුණු 02)

ඉ) රජය මෙම භාණ්ඩයේ මිල මත රුපියල් 10 ක උපරිම මිලක් නියම කළේ නම් බිහිවන අයි ඉල්ලුමත් , කළු කඩ මිලක් කොපමණද? (ලකුණු 02)

ඊ) පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම රුපියල් මිලියන 5000 ක් වීමට රජයේ මිලදී ගැනීම් කොපමණ විය යුතු ද? (ලකුණු 03)

4) කෘෂි භාණ්ඩවල / ප්‍රාථමික භාණ්ඩවල මිල ස්ථායීකරණය සඳහා යොදා ගත හැකි ක්‍රියා මාර්ග කවරේද? (ලකුණු 04)



Scanned by CamScanner


## 'ආ' උප කොටස

06\. 1) කෙටි කාලයේදී සාමාන්‍ය හා ආන්තික ඵලදා වක්‍රත් සාමාන්‍ය හා ආන්තික පිරිවැය වක්‍රත් අතර පවතින්නේ කුමන සම්බන්ධයක්ද? (ලකුණු 04)

2) ගිළුණු පිරිවැය හා ආරෝපිත පිරිවැය අතර වෙනස කවරේද? (ලකුණු 04)

3) පූර්ණ තරඟකාරී වෙළඳපොළ තුළ කටයුතු කරන ආයතනයක කෙටි කාලයේදී ලාභ උපරිම කරන නිමැවුම තීරණය කරන්නේ කෙසේද? එම ප්‍රවේශය රූප සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

4) පහත දැක්වෙන්නේ පූර්ණ තරඟකාරී වෙළඳපොළ ආයතනයට අදාළ පිරිවැය තත්වයන්ය.




ප්‍රස්ථාර සටහනට අනුව

I. නිමැවුම ඒකක 40 දී මුළු විචල්‍ය පිරිවැය හා මුළු ස්ථාවර පිරිවැය කොපමණද? (ලකුණු 02)

II. මිල රු: 20/= දී ආර්ථික ලාභය කොපමණද? (ලකුණු 02)

III. ආයතනය වසා දැමීමට තීරණය කරන්නේ කවර මිලකදීද? (ලකුණු 02)

5) කෙටි කාලයේදී පූර්ණ තරඟකාරී ආයතනයක් පාඩු සහිතව වුවද නිෂ්පාදනයේ යෙදී සිටින්නේ මන්ද? (ලකුණු 02)

07\. 1) ආර්ථික ලාභය ගිණුම්කරණ ලාභයෙන් වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 04)

2) ආරෝපිත පිරිවැයෙහි ඇතුලත් ප්‍රධාන සංරචක කවරේද? (ලකුණු 04)

3) කතිපයාධිකාරය, ඒකාධිකාරයෙන් වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 04)

4) පූර්ණ තරඟකාරී ආයතනයක කෙටි කාලීන සැපයුම් වක්‍රය ව්‍යුත්පන්න කරගන්නා ආකාරය රූප සටහනකින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

5) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන පහත දැක්වෙන කර්මාන්ත වලට අදාළ වෙළඳ පල ආකෘතිය නම් කරන්න.

- රක්ෂණ සේවා
- විදුලි බල සැපයුම ඒකාධිකාර
- වී ගොවිතැන පූර්ණ තර
- ආපන ශාලා
- දුම්රිය සේවා ඒකාධිකාරී
- දුරකථන සේවා පූර්ණ තරඟකාරී

(ලකුණු 04)

08\. 1) " ව්‍යාපාර චක්‍රයක්" යන්න නිර්වචනය කර ඊට අදාළ චක්‍රයක අවධි 4 නම් කර පෙන්වන්න. (ලකුණු 04)

2) සාර්ව ආර්ථික අරමුණු පුළුල් වශයෙන් ප්‍රධාන කොටස් 2 කට බෙදේ.මෙම කොටස් 2 නම් කොට ඊට අයත් අරමුණු වෙන් වෙන් වශයෙන් දක්වන්න. (ලකුණු 04)

www.artsapi.lk



Scanned by CamScanner

3) සාර්ව ආර්ථික අරමුණු සාක්ෂාත්කර ගැනීමට යොදා ගැනෙන ප්‍රධාන ප්‍රතිපත්ති කවරේද? (ලකුණු 02)

4) "නිමැවුම පරතරය" යනුවෙන් කුමක් අදහස් වේද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

5) සාර්ව ආර්ථිකයක චක්‍රීය ප්‍රවාහයේ සරල ආකෘතියක් ඇද නම් කරන්න.. (ලකුණු 04)

09. 1) රටක ජාතික ආදායම ඇස්තමේන්තු ගණනය කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රම 3 හඳුන්වන්න. (ලකුණු 03)

2) වියදම් ප්‍රවේශය යටතේ වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී ඇතුලත් කරන සංරචක කවරේද? (ලකුණු 04)

3) "එකතුකළ අගය" යන්නෙන් කුමක් අදහස් වේද?එය කවර සංරචක වලින් සමන්විත වේද? (ලකුණු 04)

4) පහත සඳහන් දෑ මගින් දළ දේශීය නිෂ්පාදිතයට ඇති කරන බලපෑම දක්වන්න.
(අ) සමාගමක් රජයට සෘජු බදු ගෙවීම
(ආ) විශ්‍රාමික පුද්ගලයෙක් පොතක් මිලදී ගැනීම
(ඇ) විදේශීය ආයෝජකයෙකු දේශීය සමාගමක කොටස් මිලදී ගැනීම
(ඉ) ගෘහනියන් නිවස පිරිසිදු කිරීම
(ඊ) රජය සේවකයන්ට වැටුප් ගෙවීම

(එක් කොටසකට ලකුණු 01 බැගින්)

5)

| | රුපියල් මිලියන |
|---|---|
| සේවක ආදායම | 5000 |
| පෞද්ගලික පාරිභෝජන වියදම | 1000 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 2000 |
| මිශ්‍ර ආදායම | 2500 |
| නිෂ්පාදනය මත බදු | 3000 |
| භාණ්ඩ හා සේවා මත අයකරන බදු | 1500 |

ආර්ථිකයක ජාතික ගිණුම් වලට අදාළ දත්ත කිහිපයක් මෙහි දැක්වේ.එම දත්ත සැලකිල්ලට ගෙන
i. මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය (ලකුණු 02)
ii. වෙළඳපල මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්න. (ලකුණු 02)

10. 1) " සාර්ව ආර්ථික සමතුලිතතාව " යන්නෙන් කුමක් අදහස් වේද? (ලකුණු 04)

2) සුදුසු ප්‍රවේශ 2 ක් යොදා ගෙන සරල ආර්ථිකයක සමතුලිතතාව ප්‍රස්ථාරිකව නිරූපණය කරන්න. (ලකුණු 04)

3)

| වැය කළ හැකි ආදායම | පාරිභෝජන වියදම රු:මි |
|---|---|
| 1000 | 850 |
| 2000 | 1650 |
| 3000 | 2450 |
| 4000 | 3250 |

ඉහත දත්ත භාවිත කර පාරිභෝජන ශ්‍රිතය හා ඉතුරුම් ශ්‍රිත ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 04)

4). ආයෝජනය (I) = 290
රාජ්‍ය වියදම (G) = 200
බදු ආදායම (T) = 0.2 Y 100

අ) ඉහත (3) හි පිළිතුර හා මෙම තොරතුරු ඇසුරින් සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 02)

ආ) සමතුලිත ආදායමේදී ඉතුරුම කොපමණද? (ලකුණු 02)

5) අ) රාජ්‍ය වියදම රු:මි: 300 දක්වා වැඩි කරනු ලැබුවහොත් නව සමතුලිත ආදායම කොපමණද? (ලකුණු02)

ආ) මෙම ආර්ථිකයේ ආයෝජන ගුණකය ගණනය කරන්න. (ලකුණු 02)

G = T + Y
300 = 100

* * * * *



www.artsapi.lk

Scanned by CamScanner